ශ්‍රී ලංකා දේශීය ආදායම්

இலங்கை உள்நாட்டு இறைவரி

Sri Lanka Inland Revenue

සංස්ථාපිත ආදායම් බදු වාර්තාව සඳහා උපදෙස් මාලාව

තක්සේරු වර්ෂය - 2017/2018

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාර, ආයෝජන මණ්ඩල සමාගමක්, රාජ්‍ය සංස්ථාවක්, ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් ඇතුලුව සෑම වාසික හෝ නිර්වාසික සමාගමක් හෝ යම් සංස්ථාවක් විසින් ම දේශීය ආදායම් පනතේ 106 වන වගන්තිය යටතේ නියම කර ඇති පරිදි 2017/2018 තක්සේරු වර්ෂය සඳහා සංස්ථාපිත ආදායම් බදු වාර්තාව (ආකෘති පත්‍ර අංක ASMT_CIT_001_S) විගණනය කරන ලද ගිණුම් සහ උපලේඛන (ආකෘති පත්‍ර අංක ASMT_CIT_002_S) සමඟ 2018 නොවැම්බර් 30 වන දින හෝ එදිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

විද්‍යුත් ගොනු ගත කිරීම දේශීය ආදායම් වෙබ් අඩවිය හරහා කරගත හැකිය. මෙම වෙබ් අඩවියෙන් ලබා දී ඇති කඩිනම් උපදෙස් කෙරෙහි කාරුණික අවධානය යොමු කරන්න.

2013.08.12 දිනැති අංක 1823/5 දරන විශේෂ ගැසට් නිවේදනය මඟින් පළ කරන ලද පැවරුම් මිල නියෝගයේ 9 වන සහ 10 වන නියෝගයන් සහ තදනන්තරව 2016.03.31 දිනැති අංක 1960/39 දරන විශේෂ ගැසට් නිවේදනය මඟින් සංශෝධිත පරිදි ආශ්‍රිත ව්‍යවසායන් සමඟ අන්තර්ජාතික ගණුදෙනුවල නිරත තැනැත්තන් විසින් ආදායම බදු වාර්තාව සමඟ

(i) පැවරුම් මිල හෙළිදරව් කිරීමේ ආකෘති පත්‍රය

(ii) අධ්‍යක්ෂ/ප්‍රධාන නිලධාරියා/ප්‍රමුඛ හවුල්කරුගේ සහතිකය

ඉදිරිපත් කළ යුතුය. **අදාළ ආකෘති පත්‍ර දේශීය ආදායම් වෙබ් අඩවියෙහි ආදායම් වාර්තා යටතේ දක්වා ඇත.**

නියම කරනු ලබන හෝ ඉල්ලා සිටිනු ලබන පරිදි විගණනය කරන ලද අදාළ ගිණුම් හෝ ඉහත සඳහන් උපලේඛන නොමැතිව හෝ ඇස්තමේන්තුගත ආදායම් සංඛ්‍යා යනාදිය සමඟ වාර්තාවක් ගොනුගත කරන යම් සමාගමක් දේශීය ආදායම් පනතේ කාර්යය සඳහා වාර්තාවක් ඉදිරිපත් **නොකරන ලද සේ සලකනු ලැබේ.**

වාර්තාව **උපලේඛන දහතුනකින්** සමන්විත වන අතර ඒවා 1, 2, 3, 3(අ), 3(ආ), 4, 5, 6, 6 (අ), 6(ආ), 7, 7(අ) සහා 7(ආ) ලෙස දැක්වේ. මෙම තක්සේරු වර්ෂයේදී, අදාළ සටහන් ආගණනය කිරීමේ පහසුකම් සැලසීම පිණිස බදු ආගණනය කිරීමේ පත්‍රිකාවෙහි මුද්‍රිත පිටපතක් ලබා දී නොමැති අතර එය බාගතකර ගැනීම පිණිස දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි දක්වා ඇත. (www.ird.gov.lk)

වාර්තාවේ හෝ උපලේඛන වල ඉලක්කමෙන් දත්ත ඇතුළත් කළ යුතු ස්ථාන වල එම තොරතුරු **සඳහන් කිරීමට අවශ්‍ය නොවන අවස්ථාවලදී** අදාළ නැත යනුවෙන් සඳහන් නොකළ යුතු අතර කෙටි ඉරක් පමණක් යෙදීම කළ යුතුය. යම්කිසි උපලේඛනයක අකුරෙන් ලිවීමට ඇති ස්ථානයක **ඉඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවකදී** අමුණා ඇති ලේඛනය බලන්න යනුවෙන් සඳහන් කර අදාළ උපලේඛනයේ ලබා දී ඇති ආකෘති පත්‍රයට සමාන ලේඛනයක් ඇමිණිය යුතුය.

නිවැරදි නොවන දත්ත ඇතුළත් කිරීමකට උදාහරණය

එකතු ව්‍යවස්ථාපිත ආදායම් (20+30+40+50+60+70)	80						1	0	0	0	0	0	0
එකතු ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් නොවන ආදායම්	90			අ	දා	ළ		නැ	ත				
කතු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කිරීම්													
වෙළඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් අඩුකළ හැකි අලාභ (උපලේඛන3, 3(අ),3(ආ))	100		අ	දා	ළ		නැ	ත					
ගෙවූ පොලී, වාර්ෂික, බිම් කුලී හෝ රාජ්‍ය භාග	110							2	0	0	0	0	0
එකතු ව්‍යවස්ථාපිත ආදායමෙන් මුළු අඩුකිරීම් (100+110)	120							2	0	0	0	0	0
තක්සේරුවන ආදායම (120>80 නම්,එවිට "0"වේ) (80-120)	130							8	0	0	0	0	0

නිවැරදි දත්ත ඇතුළත් කිරීමකට උදාහරණය

එකතු ව්‍යවස්ථාපිත ආදායම් (20+30+40+50+60+70)	80						1	0	0	0	0	0	0
එකතු ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් නොවන ආදායම්	90			-	-	-	-	-	-	-			
කතු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කිරීම්													
වෙළඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් අඩුකළ හැකි අලාභ (උපලේඛන3, 3(අ),3(ආ))	100			-	-	-	-	-	-	-			
ගෙවූ පොලී, වාර්ෂික, බිම් කුලී හෝ රාජ්‍ය භාග	110							2	0	0	0	0	0
එකතු ව්‍යවස්ථාපිත ආදායමෙන් මුළු අඩුකිරීම් (100+110)	120							2	0	0	0	0	0
තක්සේරුවන ආදායම් (120>80 නම්,එවිට "0"වේ) (80-120)	130							8	0	0	0	0	0

උපලේඛනයන්හි සාරාංශමය සටහන පහත සඳහන් පරිදි වේ.

උපලේඛන 1 - බද්දෙන් නිදහස් ලාභ සහ ආදායම්

එක් එක් ප්‍රභවයෙන් තක්සේරු වර්ෂය තුළ උපයන ලද නිදහස් ලාභ සහ ආදායම මෙම උපලේඛනය මගින් ප්‍රකාශ කළ යුතුය.

උපලේඛනය (2) - වෙළෙඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් උපයන ලාභ

එක් එක් ව්‍යාපාරයෙන් තක්සේරු වර්ෂය තුළ උපයන ලද පිරිවැටුම සහ ගලපන ලද ලාභය අදාළ කාර්යය කේතය සමඟ මෙම උපලේඛන මගින් ප්‍රකාශ කළ යුතුය. අදාළ කොටුව තුළ නිවැරදි කාර්යය කේතය සඳහන් කළ යුතු අතර කාර්යය කේතය ලැයිස්තුව දේශීය ආදායම් වෙබ් අඩවියෙහි දක්වා ඇත.

උපලේඛනය 3 - අලාභ

අලාභ අඩු කිරීම පහසු කිරීම සඳහා, අදාළ වර්ෂයේ අලාභ, පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙන එනු ලැබූ අලාභ සහ 2018.03.31 දිනට හිලව් නොකර ඉදිරියට ගෙන යන අලාභ වෙන් වෙන් වශයෙන් උපලේඛන 3, 3අ සහ 3ආ හි නිශ්චිතව දැක්විය යුතුය.

උපලේඛනය 3 (අ) - ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙන් ලද අලාභ

ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙන් දරන ලද අලාභ මෙම උපලේඛනයෙහි ඇතුළත් කළ යුතුය. කෙසේ වෙතත්, එම අඩු කළ හැකි අලාභය සහ ඉදිරියට ගෙන එන ලද අඩු කළ හැකි අලාභ වල එකතු අඩු කිරීම් තක්සේරු වර්ෂය සඳහා වූ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් සියයට 35 ක උපරිමයකට යටත් නොවේ. අඩු කළ නොහැකි යම් අලාභයක් ඉදිරි තක්සේරු වර්ෂයන්ට ගෙන යා හැකිය.

උපලේඛනය 3 (ආ) - මූල්‍ය කල්බදු ව්‍යාපාරයෙන් ලද අලාභ

මූල්‍ය කල්බදු ව්‍යාපාරයෙන් දරන ලද අලාභ මෙම උපලේඛනයෙහි ඇතුළත් කළ යුතුය. කෙසේ වෙතත්, එම අඩු කළ හැකි අලාභය සහ ඉදිරියට ගෙන එන ලද අඩු කළ හැකි අලාභවල එකතු අඩු කිරීම් තක්සේරු වර්ෂය සඳහා වූ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් සියයට 35 ක උපරිමයකට යටත් නොවේ. අඩු කළ නොහැකිවූ යම් අලාභයක් ඉදිරි තක්සේරු වර්ෂයන්ට ගෙන යා හැකිය. එහෙත් අලාභ අඩුකල යුතු වන්නේ ඒ හා සමාන ව්‍යාපර වලින් ලැබූ ලාභ වලින් පමණි.

උපලේඛනය 4 - සුදුසුකම් ලබන ගෙවීම්

තක්සේරු වර්ෂ 2017/2018 තුළ කරන ලද සෑම සුදුසුකම් ලබන ගෙවීමක්ම, මීට පෙර තක්සේරු වර්ෂයේ සිට එම ගෙවීමෙන් ඉදිරියට ගෙන එන ලද යම් ශේෂයක් සහ වර්ෂය සඳහා එම සුදුසුකම් ලබන ගෙවීමෙන් අඩු කළ හැකි වටිනාකම මෙම උපලේඛනය මඟින් ප්‍රකාශ කළ යුතුය.

උපලේඛන 5 - බදු අය කළ හැකි ආදායම මත බදු

සාමාන්‍ය අනුප්‍රමාණයන්ට සහ විශේෂ අනුප්‍රමාණයන්ට යටත් බදු අයකළ හැකි ආදායම මෙම උපලේඛනය මඟින් ප්‍රකාශ කළ යුතුය.
සාමාන්‍ය අනුප්‍රමාණයන් දේශීය ආදායම් පනතේ දෙවන උපලේඛනයේ (ආ) කොටසෙහි නිශ්චිතව දක්වා ඇත. ඇතැම් අවස්ථාවලදී විශේෂ අනුප්‍රමාණයන් යටතේ බදු අය කරනු ලැබේ. නිදසුන් වශයෙන්, ආයෝජන මණ්ඩල ව්‍යවසායන්, අවදානම් ප්‍රාග්ධන සමාගම්, ඒකක භාර යනාදිය සඳහා අඩු බදු අනුප්‍රමාණයන් නිශ්චිතව දක්වා ඇත. එය දේශීය ආදායම් පනතේ දෙවන උපලේඛනයේ (ආ) කොටසේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයක් හැර වූ අනුප්‍රමාණයන් මගින් නිශ්චිතව දක්වා ඇත. විශේෂ අනුප්‍රමාණයන්ට අදාළ නිවැරදි සංකේත අංකය සඳහන් කළ යුතු අතර සංකේත අංක ලැයිස්තුව දේශීය ආදායම් වෙබ් අඩවියෙහි දක්වා ඇත.

උපලේඛනය 6 - ප්‍රකාශිත ලාභාංශ

තක්සේරු වර්ෂය තුළ බෙදා හරින ලද එක් එක් ලාභාංශයන් සම්බන්ධයෙන් මෙම උපලේඛනය අදාළ වේ.

උපලේඛනය 6 (අ) - ප්‍රේෂණ මත බද්ද

මෙම උපලේඛනය නිර්වාසික සමාගම් වලට පමණක් අදාල වේ.

උපලේඛනය 6 (ආ) - බෙදා හැරිය හැකි ලාභ මත බද්ද

යම් සමාගමක් විසින් 2017/2018 තක්සේරු වර්ෂය සඳහා 2016/2017 වර්ෂයේ තම බෙදා හැරිය හැකි ලාභයෙන් අවම වශයෙන් සියයට 10 ක් හෝ 2017.09.30 වන දින හෝ එදිනට පෙර බෙදා හැර නොමැති අවස්ථාවකදී එවැනි සමාගමක් විසින් මෙම උපලේඛනය සම්පූර්ණ කළ යුතුය.

උපලේඛනය 7 - බදු බැර

ගෙවන ලද ස්ව තක්සේරු ගෙවීම්, ද්විත්ව බදු සහන, ආර්ථික සේවා ගාස්තු (ESC) සහ ලාභාංශ බදු යනාදිය ඇතුලුව බදු බැර මෙම උපලේඛනය මඟින් ප්‍රකාශ කළ යුතුය.

උපලේඛනය 7 (අ) - ආර්ථික සේවා ගාස්තු

මෙම උපලේඛනය මඟින් ආදායම් බදු සඳහා හිලව් කල හැකි ආර්ථික සේවා ගාස්තු ගෙවීම් සහ ඉදිරියට ගෙන යා හැකි ආර්ථික සේවා ගාස්තු ගණනය කිරීම සඳහා පහසුකම් සලසයි.

උපලේඛනය 7(ආ) - මති මාත්‍ර බදු බැර

මති මාත්‍ර බදු බැර පිළිබඳ විස්තර මෙම උපලේඛනයෙහි ඇතුළත් කළ යුතුය.

බදු ගෙවීම

තක්සේරු වර්ෂය සඳහා බදු,

1 වන වාරිකය - 2017 අගෝස්තු 15 වන දින

2 වන වාරිකය - 2017 නොවැම්බර් 15 වන දින

3 වන වාරිකය - 2018 පෙබරවාරි 15 වන දින සහ

අවසන් වාරිකය - 2018 මැයි 15 වන දින හෝ ඊට පෙර දිනයන්හිදී සමාන වාරිකයන්ගෙන් ගෙවිය යුතුය.

2016/17 තක්සේරු වර්ෂයේ ආදායම් බදු බැදියාවෙන් ¼ ට වඩා නොඅඩු මුදලක්, නියමිත දිනට හෝ එදිනට පෙර ගෙවා ඇත්නම් හා 2017/18 තක්සේරු වර්ෂයේ ගෙවිය යුතු ඉතිරි බදු මුදල, 2018 සැප්තැම්බර් 30 දිනට පෙර ගෙවන ලද්දේ නම් ; එවිට ගෙවන ලද වාරික 4 හි හා අවසාන ගෙවීමේ එකතුව 2017/18 තක්සේරු වර්ෂය සඳහා වූ මුළු බදු බැඳියාවට සමාන වන අතර ප්‍රමාද ගෙවීම් මත දණ්ඩන අය නොකරයි.

දණ්ඩන

නියමිත දිනයන්හි දී බදු නොගෙවීම හෝ නියමිත දින හෝ එදිනට පෙර වාර්තා ඉදිරිපත් නොකිරීම හෝ සාවද්‍ය වාර්තාවක් ඉදිරිපත් කිරීම පහත සඳහන් පරිදි දණ්ඩනයන්ට යටත් වනු ඇත.

- නියමිත දින (එනම්, 2018 නොවැම්බර් 30) හෝ එදිනට පෙර වාර්තාවක් ඉදිරිපත් කිරීමට අපොහොසත්වීම වෙනුවෙන් රු.50,000/- දක්වා දණ්ඩනයක්

- නියමිත දිනයන් වන විට නොගෙවීම වෙනුවෙන් දණ්ඩනය, ගෙවිය යුතු බද්දෙන් සියයට 10 ක් සහ එක් එක් මාසය සඳහා හිඟව පවතින ශේෂය මත තවත් සියයට 2 ක වටිනාකම, උපරිම සියයට 50 දක්වා.

- සාවද්‍ය වාර්තාවක් සැකසීම වෙනුවෙන් දණ්ඩනය, අතිරේක බද්දෙන් සියයට 200 ක් නොඉක්මවන මුදලක් සහ රු.2,000/- ක මුදලක එකතුව.

1 වැනි කොටස

1. 10 වැනි කොටුව - බද්දෙන් නිදහස් ලාභ සහ ආදායම

1 වැනි **උපලේඛනයෙහි;**

I. නව ව්‍යවසායන්හි 2011.04.01 දින හෝ එදිනට පසු කරන ලද ආයෝජනයන්ගෙන් උපයන නිදහස් ලාභ සහ ආදායම(දේශීය ආදායම් පනතේ 16ඇ හෝ 17අ වගන්තිය යටතේ නිදහස් ආදායම්) හෝ නව ව්‍යවසායන්හි 2012.04.01 දින හෝ එදිනට පසු උපයන නිදහස් ලාභ සහ ආදායම (දේශීය ආදායම් පනතේ 16ඇ වගන්තිය යටතේ නිදහස් ආදායම්) 10.01 කොටුවෙහි ඇතුළත් කරන්න.

II. ආයෝජන මණ්ඩල නීතිය යටතේ නිදහස් ආයෝජන මණ්ඩල සමාගම්වල නිදහස් ලාභ 10.02 කොටුවෙහි ඇතුළත් කරන්න.

III. යම් වෙනත් නිදහස් ලාභ සහ ආදායමහි එකතුව 10.03 සිට 10.07 කොටුව දක්වා කොටුවල ඇතුළත් කරන්න. එසේම නිදහස් ලාභ වලට අදාළ දේශීය ආදායම් පනතේ වගන්තිය පළමු තීරයේ දක්වන්න.

10.08 කොටුවෙහි ඇතුළත් සියලු ප්‍රභවයන්ගෙන් උපයන නිදහස් ලාභ සහ ආදායමේ එකතුව වාර්තාවේ 10 වන කොටුවෙහි ඇතුළත් කළ යුතුය.

2. 20 – 70 වැනි කොටුව දක්වා - බද්දට යටත් ලාභ සහ ආදායම

2.1. 20 වැනි කොටුව - වෙළෙඳාම හෝ ව්‍යාපාරයෙන් උපයන ලාභ.

ආදායම් බද්දට යටත් වෙළෙඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් උපයන, මුළු ගලපන ලද ලාභය 20 වැනි කොටුවේ ප්‍රකාශ කළ යුතුය. යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් අඩුකළ හැකි අලාභයක් වෙතොත් අවස්ථානෝචිත පරිදි උපලේඛන 3, 3 (අ) හෝ 3 (ආ) හි විධිවිධාන සලසා ඇති පරිදි වටිනාකම ඇතුළත් කරන්න. (මෙම උපදෙස් මාලාවේ 5.1 අයිතමය බලන්න.)

2.2. 30 වැනි කොටුව - පොලිය

(i) බැංකුවක හෝ මූල්‍යායතනයක කරන ලද යම් තැන්පතුවකින්;
(ii) යම් සුරැකුම්පතක හෝ භාණ්ඩාගාර බිල්පතක, භාණ්ඩාගාර බැඳුම්කරයක හෝ යම් මහ බැංකු සුරැකුම්පතක් සමඟ කටයුතු කිරීමේ දී යම් ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනුවකින්;
(iii) යම් සමාගමක් මගින් නිකුත් කරන ලද, මෙම පනතේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් සංස්ථාපිත ණය සුරැකුම්පතකින්; හෝ
(iv) යම් වෙනත් ආකාරයෙන්

යම් සමාගමකට උද්ගතවන හෝ උපචිත වන පොලිය (දේශීය ආදායම් පනතේ 7 වන වගන්තියේ (අ), (ඇ), (ඈ) හෝ (උ) ඡේදයන්හි සඳහන් යම් සමාගමක් හැර) 30 වන කොටුවෙහි ඇතුළත් කළ යුතුය. සමාගමේ වෙළෙඳාම හෝ ව්‍යාපාරය ප්‍රධාන වශයෙන් මුදල් ණයට දෙන අවස්ථාවක දී, එවිට පොලිය 20 වැනි කොටුවෙහි ඇතුළත් කළ යුතු ය. (සියයට 10 යටතේ රඳවාගන්නා ලද බද්ද 220.07 වැනි කොටුවෙහි ඇතුළත් කරන්න.)

සියයට 10 බැගින් රඳවාගැනීමේ බදු අඩුකල පොලිය (උදාහරණ: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වැනි රාජ්‍ය ආයතනයක් මගින් ගෙවිය යුතු වන්දියක් මත පොලිය යනාදිය) මුළු ව්‍යවස්ථාපිත ආදායමේ කොටසින් සමන්විත නොවන ආදායම, 90 වැනි කොටුවෙහි දක්වා ඇති එකතු ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් නොවන ආදායම් යටතේ ඇතුළත් කළ යුතුය.

යම් සුරැකුම්පතක්, භාණ්ඩාගාර බිල්පතක්, භාණ්ඩාගාර බැඳුම්කරයක් හෝ යම් මහ බැංකු සුරැකුම්පතක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනුවකින් උපයන යම් පොලියක් සම්බන්ධයෙන් **"මති මාත්‍ර බදු බැර"** සඳහා හිමිකම් පාන විට, ඒ මත හිමිකම් කිව යුතු අදාළ පොලියේ වටිනාකම සහ **මති මාත්‍ර** බදු බැර වටිනාකම 07 වන උපලේඛනයේ 220.08 වැනි කොටුව මඟින් ප්‍රකාශ කළ යුතු ය.

එහි ආදායම් බදු බැඳියාවට අතිරික්තව යම් බැරක් වේ නම්, එම අතිරික්තය යම් අනාගත ආදායම් බද්ද එරෙහිව හිලව් කළ හැකි පරිදි ඉදිරියට ගෙන එනු ලැබිය හැකි නමුත් අතිරික්තය ආපසු ගෙවිය නොහැකි ය.**මීට අදාළ විගණකවරුන්ගෙන් ලබා ගන්නා ලද සහතිකයක් ඇමිණිය යුතු ය.**

නිදහස් පොළිය 10 වන කොටුවෙහි ඇතුළත් කළ යුතු ය. (30 වන කොටුවෙහි නොවේ.)

සටහන: ප්‍රාථමික වෙළෙන්දෙකුගේ වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් උපයන ව්‍යවස්ථාපිත ආදායම, යම් සුරැකුම්පතක්, භාණ්ඩාගාර බිල්පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් මත යම් ප්‍රාථමික වෙළෙඳපොළ ගනුදෙනුවකින් එම වෙළෙඳාමෙන් ලද හෝ

උපචිත වන යම් පොලියක්, ප්‍රාථමික නිකුතුවක දී බදු අඩු කර ඇත්නම්, 90 වන කොටුවෙහි ඇතුළත් කළ යුතු ය.

2.3. 40 වැනි කොටුව - ලාභාංශ

වාසික සහ නිර්වාසික සමාගම් වලින් ලද මුළු ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් නොවන යම් ලාභාංශයක් හැර දළ ලාභාංශ වටිනාකම 40 වන කොටුවෙහි ඇතුළත් කළ යුතු ය. ලාභාංශ අර්ථකථනයට අනුව ලාභාංශයක් ලෙස සලකනු ලැබිය නොහැකි යම් ප්‍රසාද කොටස් හෝ ප්‍රාග්ධනය බෙදා දීම ඇතුළත් නොකරන්න.

සමස්ථ ව්‍යවස්ථාපිත ආදායම් කොටසකින් සමන්විත නොවන යම් දළ ලාභාංශයක් 90 වන කොටුවෙහි ඇතුළත් කළ යුතුය. කරුණාකර මෙම උපදෙස් මාලාවේ 4 වන අයිතමය බලන්න.

2.4. 50 වැනි කොටුව - කුලී

සමාගමක් විසින් යම් ඉඩමක් ඇතුළුව පරිශ්‍රයක් කුලියට හෝ බද්දට දීමෙන් උපයන ආදායම ව්‍යාපාරයෙන් උපයන ආදායමක් ලෙස සලකනු ලබන බව කාරුණිකව සලකන්න. එවන් අවස්ථාවක දී, පරිශ්‍රයට අදාළ අලුත්වැඩියා කිරීම් සඳහා වියදම අඩු කිරීම දළ කුලියෙන් සියයට 25 කට සීමා වේ. එම ආදායම 20 වැනි කොටුවෙහි ඇතුළත් කළ යුතු ය. වෙනත් ආකාරයේ කුලී පමණක් 50 වන කොටුවෙහි ඇතුළත් කළ යුතු ය.

2.5. 60 වැනි කොටුව - වාර්ෂිකයන්, බිම් කුලී සහ රාජ්‍ය භාගයන්ගෙන් උපයන ආදායම

වාර්ෂිකය, බිම් කුලී සහ රාජ්‍ය භාගයන්ගෙන් ලද සහ ලැබිය යුතු ආදායමේ මුළු වටිනාකම 60 වන කොටුවෙහි ඇතුළත් කළ යුතු ය.

2.6. 70 වැනි කොටුව - වෙනත් ප්‍රභවයන්ගෙන් ලද ලාභ

ප්‍රාථමික වෙළෙඳාමෙන් හෝ ව්‍යාපාරයෙන්, යම් පොලියක්, ලාභාංශයක්, කුලියක්, වාර්ෂිකයක් හෝ රාජ්‍ය භාගයක් හැර වෙනත් යම් ප්‍රභවයකින් සමාගමකට උද්ගත වන මුළු ලාභය හෝ ආදායම 70 වන කොටුවෙහි ඇතුළත් කරන්න. වෙනත් ආදායම් ප්‍රභවයන්ගේ ස්වභාවය පිළිබඳ විස්තර සඳහන් කරන්න.

3. 80 වැනි කොටුව - එකතු ව්‍යවස්ථාපිත ආදායම

අංක 20, 30, 40, 50, 60 සහ 70 කොටුවල දක්වා ඇති මුළු වටිනාකම්, මුළු ව්‍යවස්ථාපිත ආදායම් ලෙස 80 වන කොටුවෙහි ඇතුළත් කළ යුතු ය.

4. 90 වැනි කොටුව - එකතු ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් නොවන ආදායම්

එකතු ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් නොවන වෙනත් ආදායම් වේ නම්, මෙම කොටුවෙහි දැක්විය යුතු ය. උදාහරණ: 10% යටතේ බදු අඩු කිරීමෙන් පසු වෙනත් වාසික සමාගමකින් ලද ලාභාංශයක්; 10 වන වගන්තිය යටතේ නිදහස් ලාභාංශ; වෙනත් වාසික සමාගමකින් එම සමාගමක් විසින් ලාභාංශ හෝ වාසික සමාගමක් විසින් ප්‍රකාශිත ලාභාංශය, මිල ලේඛනගත පොදු සමාගමක් විසින් ප්‍රකාශිත ලාභාංශ, දේපළ අත්පත් කර ගැනීම සඳහා වන්දි මත ඉඩම්

ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ලද පොලිය, අඩු කරන ලද බද්ද, ප්‍රාථමික වෙළෙන්දෙකු සම්බන්ධයෙන් වන විට, ප්‍රාථමික ගණුදෙනු සඳහා ලද පොලිය යනාදිය.

එක් ප්‍රභවයකට වඩා ප්‍රකාශනයේ අන්තර්ගත වේ නම්, වෙන ම උපලේඛනයක් අමුණන්න.

5. 100 හා 110 වැනි කොටු - එකතු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කිරීම

5.1. 100 වැනි කොටුව – අඩු කළ හැකි අලාභ (උපලේඛනය 3, 3 අ සහ 3 ආ)

ජීවිත රක්ෂණ සහ මූල්‍ය කල්බදු ව්‍යාපාරයක දී හැර යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රැකියාවක දී දරන ලද අලාභයක් වෙනුවට අඩු කිරීමක් ලෙස ඉඩ දෙනු ලැබේ. අලාභයක් වෙනුවට, එය ලාභයක් වූයේ නම්, එය තක්සේරු කරනු ලැබිය හැකිය. කෙසේ වෙතත්, එම අඩු කළ හැකි අලාභය සහ ඉදිරියට ගෙන එන ලද අඩු කළ හැකි අලාභ වල එකතු අඩු කිරීම්, තක්සේරු වර්ෂය සඳහා වූ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් සියයට 35 (35%) ක උපරිමයකට යටත් වේ. (එනම්,80 වැනි කොටුවෙහි වටිනාකමෙන් සියයට 35). එලෙස අඩු කළ නොහැකි වූ යම් අලාභයක් ඉදිරි තක්සේරු වර්ෂයන්ට අදාළව ඉදිරියට ගෙන එනු ලැබිය හැකි අතර, එම පදනම මත අඩු කරනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන උපදෙස් මාලාවන්ට අනුව සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති කොන්දේසි වලට යටත්ව, බද්ධ කරනු ලැබූ, ඒකාබද්ධ කරනු ලැබූ හෝ අත්පත් කරගනු ලැබූ යම් බැංකුවක්, මූල්‍යයාතනයක් හෝ කල්බදු සමාගමක් වන යම් ව්‍යාපාරයක යම් අලාභයක ශේෂයක් ඇත් නම් සහ එම ඒකාබද්ධ කිරීම, පවරා ගැනීම හෝ එක් කිරීමට පෙර එකී අලාභයක් 32 වන වගන්තිය යටතේ හිමිකම් පෑමට හැකි වී තිබුණි නම් හැකි නම්, මෙම තක්සේරු වර්ෂය සඳහා මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් සියයට 35 ක උපරිමයකට යටත්ව අඩු කරනු ලැබිය හැකිය.

වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රැකියාවක ලාභ සහ ආදායමෙන් අඩු කළ නොහැකි වාර්ෂිකයක්, හෝ පොලියක් ලෙස ගෙවන ලද යම් මුදලක් මුළු ව්‍යවස්ථාපිත ආදායමට වඩා වැඩි වන අවස්ථාවක දී, එවිට අතිරික්තය එම වර්ෂය තුළ දරන ලද අලාභයක් ලෙස ඉහත ආකාරයෙන් ම සැලකිය යුතු අතර, එය අලාභයක් ලෙස ඉදිරියට ගෙන එනු ලැබිය හැකි ය.

තෙස්මේන්තු සහිත හෝ තෙස්මේන්තු රහිතව හිමිකාරිත්වය වෙනස් කිරීමක් කර ඇති සමාගමක් විසින් දරන ලද යම් අලාභයක්, අලාභය දරන ලද සමාගමේ එම වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ ව්‍යවස්ථාපිත ආදායමට සාපේක්ෂව හැර අඩු කරනු ලැබිය නොහැකි බව කාරුණිකව සළකන්න.

ඉදිරියට ගෙන එන ලද අලාභ ඇතුළුව ජීවිත රක්ෂණ හෝ මූල්‍ය කල්බදු ව්‍යාපාරයකින් දරන ලද යම් අලාභයක් එම ව්‍යාපාරයේ ලාභයෙන් පමණක් අඩු කරනු ලැබිය හැකි ය. (කිසිදු සීමාවකින් තොරව) තුන්වන උපලේඛනයේ 100.10 කොටුවෙහි (ඉහත සඳහන් මුළු සියලු අඩුකළ හැකි පාඩු) වටිනාකම වල එකතුව වාර්තාවේ 100 වැනි කොටුවෙහි ඇතුළත් කළ යුතුය.

5.2. 110 වැනි කොටුව - ගෙවන ලද වාර්ෂිකය, පොළිය

ගෙවන ලද යම් වාර්ෂිකයක්, හෝ පොලියක් මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලබන අතර, මෙම මුදල 110 වන කොටුවෙහි ඇතුළත් කළ යුතු ය.

මෙහි දී අඩු කළ හැකි "පොලිය" වන්නේ යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ මිලදී ගැනීම සඳහා ලබා ගන්නා ලද යම් ණය මුදලක් හෝ ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා හෝ ව්‍යාපාරයක් සඳහා උපයෝජනය කර ගනු (පූර්ව ආරම්භ කිරීමේ පොලිය) ලබන වැඩ බිමක් මිල දී ගැනීම සඳහා බැංකුවක්, මූල්‍ය ආයතනයක් හෝ කොමසාරිස් ජනරාල් විසින් පිළිගන්නා ලද වෙනත් යම් ආයතනයකට නීතියක් හෝ කොන්ත්‍රාත්තුමය බැඳීමක් යටතේ ගෙවන ලද යම් පොලියකි. එසේම එය මෙම පනතේ 25 වන වගන්තිය යටතේ අඩු කරනු ලැබිය නොහැකි ය. කෙසේ වෙතත්, 26 (1) වැනි වගන්තියේ (x) ඡේදයේ හෝ (y) ඡේදයේ සඳහන් පොලියේ අතිරික්තය අඩු කරනු නොලැබේ.

සටහන: තක්සේරු වර්ෂය තුළ ගෙවන ලද යම් බිම් කුළියක් හෝ රාජ්‍ය භාගයක් එම ගෙවීම 2014.04.01 දිනට පෙර යම් කාලසීමාවක් සඳහා වේ නම් සහ වෙනත් යම් විධිවිධාන යටතේ ව්‍යාපාරයකින් උපයන ලාභ හෝ ආදායම නිශ්චිතව හඳුනා ගැනීමේ දී අඩු නොකරන්නේ නම් පමණක් අඩු කළ හැකි ය.

6. 120 වැනි කොටුව - එකතු ව්‍යවස්ථාපිත ආදායමෙන් මුළු අඩු කිරීම්.

අංක 100 සහ 110 කොටු මගින් ප්‍රකාශිත මුළු වටිනාකම් හි එකතුව මුළු ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කිරීම් එකතුව ලෙස 120 වන කොටුවෙහි ඇතුළත් කළ යුතු ය.

7. 130 වැනි කොටුව - තක්සේරු කළ හැකි ආදායම

තක්සේරු කළ හැකි ආදායම වන්නේ, එකතු ව්‍යවස්ථාපිත ආදායමෙන් 32 වන වගන්තිය අනුව ඉඩදිය හැකි අඩු කිරීම් ගැලපීමෙන් පසුව ලැබෙන ආදායම් වේ. 120 වැනි කොටුවේ වටිනාකම 80 වැනි කොටුවේ වටිනාකමින් අඩු කර 130 වැනි කොටුවෙහි ඇතුළත් කරන්න.එම අගය සෘණ අගයක් වන විට

තක්සේරු කළ හැකි ආදායම ශූන්‍ය වේ.

8. 140 වැනි කොටුව - සුදුසුකම් ලබන ගෙවීම්

වසර තුළ කරන ලද සියලු සුදුසුකම් ලබන ගෙවීම් හෝ යම් ඉදිරියට ගෙන එන ලද ශේෂයක් මෙම උපලේඛනයේ ඇතුළත් කළ යුතුය.

8.1. සුදුසුකම් ලබන ගෙවීම්:

(i) මුදල් හෝ මුදල්මය නොවන ආකාරයකින් කරන ලද පරිත්‍යාග -
- (අ) රජයට;
- (ආ) පළාත් පාලන ආයතනයකට;
- (ඇ) රජය විසින් ස්ථාපනය කරන ලද අරමුදලකට;
- (ඈ) පළාත් පාලන ආයතනයක් හෝ පළාත් සභාවක් විසින් ස්ථාපනය කරන ලදුව, අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අරමුදලක්;

(ඉ) බෞද්ධ සහ පාලි විශ්ව විද්‍යාල පනත යටතේ විශ්ව විද්‍යාල පනත යටතේ ස්ථාපනය කරන ලද බෞද්ධ හෝ පාලි විශ්ව විද්‍යාලයක් හෝ යම් උසස් අධ්‍යාපන ආයතනයක්;
(ඊ) සෙවන අරමුදල;
(උ) 'අපි වෙනුවෙන් අපි' අරමුදලට (2008.01.01 දින සිට); හෝ
(ඌ) ශ්‍රී ලංකා ජාතික වකුගඩු (සංස්ථාපිත) පනත යටතේ ස්ථාපනය කරන ලද ජාතික වකුගඩු අරමුදල ; සහ
(එ) එම වියදම්වලින් යම් අඩු නොකරන ලද ඉදිරියට ගෙන එන ලද ශේෂයක්

(ii) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් තැනැත්තකු විසින් රජයේ සංවර්ධන සැලස්මක් ඇතුළුව කිසියම් ව්‍යාපෘතියක් මත තක්සේරු වර්ෂය තුළ දරන ලද වියදමක් හෝ කලින් වර්ෂයේ ඉදිරියට ගෙන එන ලද එවැනි වියදමක අඩු නොකරන ලද යම් ශේෂයක්;

(iii) රෝගී හෝ දිළින්දන් සඳහා නේවාසික රැකවරණය සැලසීම පිණිස පිහිටුවන ලද අනුමත පුණ්‍යායතනයකට මුදලින් කරන ලද පරිත්‍යාග;

(iv) රු. මිලියන 5 කට වඩා නොඅඩු පිරිවැයක් දරා චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීම සඳහා දරනු ලබන වියදම (අවසන් කිරීමේ දින සිට දින 90 ක් තුළ දරන ලද යම් ප්‍රවර්ධනාත්මක වියදම් ඇතුළුව නිෂ්පාදන පිරිවැය)

(අ) 2007.04.01 දින හෝ එදිනට පසුව, නමුත් 2008.03.31 දිනට පෙර චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීම සඳහා දරන ලද වියදම.
(ආ) 2008.04.01 දින හෝ එදිනට පසුව චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීම සඳහා දරන ලද වියදම.

(v) පනතේ 23 වැනි වගන්තිය යටතේ සමාගමක් ආදායම් බද්දෙන් නිදහස් කාලසීමාව තුළ අවදානම් ප්‍රාග්ධන සමාගමක් විසින් නිකුත් කරන ලද පවත්නා කොටස් හැර සාමාන්‍ය කොටස් මිලදී ගැනීමේ දී, රුපියල් 500,000/- කට වඩා අඩු නොවන යම් ආයෝජනයකින් සියයට 50.

(vi) කොළඹ සහ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයන්ගෙන් පිටත යම් ප්‍රදේශයක පිහිටි දේශීය ආදායම් පනතේ 20 (2) වගන්තියේ සඳහන් නව ව්‍යවසායක කරන ලද යම් ආයෝජනයක්. (එම ආයෝජනය රුපියල් මිලියන 30 කට වඩා අඩු නොවිය යුතු අතර, එම ව්‍යවසායන්හි භාවිත කරන ලද යම් පිරියත යන්ත්‍රයක්, ලී බඩු, ගොඩනැගිලි හෝ එම ව්‍යවසාය, කෘෂිකාර්මික ව්‍යවසායක් නම් ඉඩම් විය යුතුය)

(vii) කොළඹ සහ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයන්හි දේශීය ආදායම් පනතේ 21 (2) වගන්තියේ සඳහන් ප්‍රතිස්ථාපිත ව්‍යවසායක දී දරන ලද යම් වියදමක් (එම ප්‍රතිස්ථාපිත වියදම රු. මිලියන 100 කට වඩා අඩු නොවිය යුතුය.)

(viii) 2008.04.01 දින හෝ එදිනට පසුව ආරම්භ කරන සිනමා රූපක චිත්‍රපටයක් ප්‍රදර්ශනය කරන සිනමා ගොඩනැගිල්ලක් හෝ උපකරණ සැපයීම සඳහා සහ ඩිජිටල් සජීවිකරණ තාක්ෂණය, ඩිජිටල් ප්‍රදර්ශන ක්‍රම සහ ඩොල්බි ශබ්ද පද්ධති වලින් සමන්විත වන බවට ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව විසින් සහතික කරන ලදුව දරන ලද රු. මිලියන 25 නොඉක්මවන වියදම.

(ix) 2008.04.01 දිනට පෙර ආරම්භ කරන ලද සිනමා රූපක චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම ආරම්භ කර ඇත්තා වූ සහ 2008 අප්‍රේල් 1 වන දිනට පෙර ඩිජිටල් තාක්ෂණය, ඩිජිටල් ප්‍රදර්ශන ක්‍රම සහ ඩොල්බි ශබ්ද පද්ධති වලින් සමන්විත නොවූ ද ශ්‍රී ලංකාවේ ජාතික චිත්‍රපට සංස්ථාව විසින් සහතික කරන ලද සිනමා ශාලාවක තත්ත්වය ඉහළ තත්ත්වයට නංවාලීමෙහි ලා දරන ලද රු. මිලියන 10 ක් නොඉක්මවන වියදම්.

(x) කොළඹ සහ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයන්ගෙන් පිටත යම් ප්‍රදේශයක දේශීය ආදායම් පනතේ 21 අ වගන්තියෙහි සඳහන් ප්‍රතිස්ථානගත කරන වියදම් රු. මිලියන 100 ට වඩා අඩු නොවිය යුතු ය.

(xi) දේශීය ආදායම් පනතේ 13 (222) වගන්තියෙහි සඳහන් අඩු ආදායම් පවුල් සඳහා නිවාස ඉදිකිරීමේ දී දරන ලද වියදම්.

(xii) කොමසාරිස් ජනරාල් විසින් හඳුනාගන්නා ලදුව සහ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද පරිදි ආර්ථික වශයෙන් පසුගාමී ගම්මානයක කරගෙන යන යම් ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියක දී දරන ලද වියදම්.

(xiii) 16 ඇ වැනි වගන්තිය හෝ 17 අ වගන්තිය (නව ව්‍යවසායක් ලෙස) යටතේ නිදහස් කිරීම සඳහා සුදුසුකම් ලබන සහ නිශ්චිත කටයුතු වල නිරත යම් ව්‍යවසායක් පුළුල් කිරීමෙහි 2011 අප්‍රේල් 01 වන දින හෝ එදිනට පසුව සහ 2014 අප්‍රේල් 01 දිනට පෙර ස්ථාවර වත්කම්හි (රු. මිලියන 50 කට නොවැඩි) කරන ලද ආයෝජනය. කෙසේ වෙතත් නිශ්චිත කටයුතු වල නිරත යම් තැනැත්තකු විසින් කරන ලද යම් ආයෝජනයක් සහ 2015.03.31 දිනට පෙර දේශීය ආදායම් පනතේ 34 (2) වගන්තියේ අතුරු විධිවිධාන සපුරාලීමට යටත්ව උසස් තාක්ෂණික පිරියත, යන්ත්‍ර, උපකරණයන්හි එම ආයෝජනය කරන ලද අවස්ථාවක දී එම කොන්දේසිවලට යටත්ව සුදුසුකම් ලැබීමේ ගෙවීම අඩු කරනු ලැබේ.

(xiv) 16 ඈ වගන්තිය යටතේ නියම කරන ලද අදාළ වටිනාකමට වඩා අඩු නොවන රෙදි, ඖෂධ, කිරිපිටි හෝ සිමෙන්ති නිෂ්පාදනය කිරීමේ නිරත යම් ව්‍යවසායක 2012 අප්‍රේල් 1 වන දින හෝ එදිනට පසුව ව්‍යාපාර කටයුතු ආරම්භ කර කරන ලද ආයෝජනයක් .

(xv) වෙනත් යම් බැංකුවක් හෝ මූල්‍ය සමාගමක් අත්පත් කර ගැනීම හෝ ඒකාබද්ධ කිරීමේ ආකාරයෙන් යම් බැංකුවක් හෝ යම් මූල්‍ය සමාගමක් විසින්, 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද උපදෙස් මාලාවට අනුව, එම පිරිවැය නිශ්චිතව හඳුනා ගනු ලබන විට, දරන ලද වියදම්.

කරුණාකර සැලකිල්ල යොමු කරන්න: සුදුසුකම් ලැබීමේ ගෙවීමක් ලෙස යම් හිමිකමක් සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි අමුණන මෙන් ඔබෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

8.2. සුදුසුකම් ලැබීමමේ ගෙවීම් සම්බන්ධයෙන් අඩු කිරීම්:

සුදුසුකම් ලැබෙන ගෙවීමේ දීමනාව වැඩි කරන ලද/ආයෝජනය කරන ලද තථ්‍ය වටිනාකම හෝ පහත සඳහන් සීමාව යන දෙකින් අඩු අගයේ ප්‍රමාණයට පමණක් ලබා ගත හැකිය.

(i) 1 වන උපඡේදයේ (**i) , (vii) සහ (xi)** අයිතමයන්හි සඳහන් සුදුසුකම් ලැබීමේ ගෙවීම් අඩු කිරීමේ දී සීමා කිරීමක් නොමැත.

(ii) 1 වන අයිතමයේ (iii) වන අයිතමයෙහි සඳහන් සියලු සුදුසුකම් ලැබීමේ ගෙවීම් හි එකතුව සම්බන්ධයෙන් අඩු කිරීම තක්සේරු කළ හැකි ආදායමෙන් 1/5 කට හෝ රුපියල් 500,000/- යන දෙකින් කවර හෝ අඩු අගයට සීමා වේ.

(iii) 1 වන අයිතමයේ (iv) වන අයිතමයෙහි සඳහන් යම් සුදුසුකම් ලැබීමේ ගෙවීමක් සම්බන්ධයෙන් (එනම්, චිත්‍රපටයක පිරිවැය) අඩු කිරීම

(iv) (අ) චිත්‍රපට එකකට රු. මිලියන 25 බැගින්
(iv) (ආ) චිත්‍රපට එකකට රු. මිලියන 35 බැගින් සීමා වේ.

(iv) 1 වන අයිතමයේ (ii), (v) සහ (x) හි සඳහන් සුදුසුකම් ලැබීමේ ගෙවීම සම්බන්ධයෙන් අඩු කිරීම තක්සේරු කළ හැකි ආදායමෙන් 1/5 කට හෝ දරන ලද තථ්‍ය වියදම් යන දෙකින් කවර හෝ අඩු අගයට සීමා වේ.

(v) 1 වන අයිතමයේ (vi) හි සඳහන් සුදුසුකම් ලැබීමේ ගෙවීම සම්බන්ධයෙන් අඩු කිරීම, රුපියල් මිලියන 100 හෝ දරන ලද තථ්‍ය වියදම යන දෙකින් කවර හෝ අවම අගයට සීමා වේ.

(vi) 1 වන අයිතමයේ (viii) හි සඳහන් සුදුසුකම් ලැබීමේ ගෙවීම සම්බන්ධයෙන් අඩු කිරීම රු. මිලියන 25 හෝ දරන ලද තථ්‍ය වියදම යන දෙකින් කවර හෝ අවම අගයට සීමා වේ.

(vii) 1 වන අයිතමයේ (ix) හි සඳහන් සුදුසුකම් ලැබීමේ ගෙවීම සම්බන්ධයෙන් අඩු කිරීම රුපියල් මිලියන 10 හෝ දරන ලද තථ්‍ය වියදම් යන දෙකින් කවර හෝ අවම අගයට සීමා වේ.

(viii) 1 වන අයිතමයේ (xii) හි සඳහන් සුදුසුකම් ලැබීමේ ගෙවීම සම්බන්ධයෙන් අඩු කිරීම රුපියල් මිලියන 10 හෝ දරන ලද තථ්‍ය වියදම යන දෙකින් කවර හෝ අවම අගයට සීමා වේ.

(ix) 1 වන අයිතමයේ (xiii) සහ (xiv) හි සඳහන් සුදුසුකම් ලැබීමේ ගෙවීම සම්බන්ධයෙන් අඩු කිරීම සුදුසුකම් ලැබීමේ ගෙවීමෙන් සියයට 25 කට සීමා වේ.

(x) 1 වන අයිතමයේ (xv) හි සඳහන් සුදුසුකම් ලැබීමේ ගෙවීම සම්බන්ධයෙන් අඩු කිරීම තක්සේරු කළ හැකි ආදායමෙන් 1/3 කට හෝ රු. 300, 000,000 යන දෙකින් කවර හෝ අඩු අගයට සීමා වේ.

8.3. අඩු නොකරන ලද සුදුසුකම් ලැබීමේ ගෙවීම් ඉදිරියට ගෙන යාම:

යම් සුදුසුකම් ලැබීමේ ගෙවීමෙහි ශේෂයක් වේ නම්,

- අනු ඡේදයේ **(i), (ii), (iv)(a), (iv)(b), (vi), (vii), (viii), (ix), (xi)** සහ **(xv)** අයිතමයන් එම සුදුසුකම් ලැබීමේ ගෙවීමේ මුළු වටිනාකම අඩු කරනු ලබන තුරු ඉදිරියට ගෙන එනු ලැබ අඩු කරනු ලැබිය හැකිය.
- **(xiii)** සහ **(xiv)** අයිතමයෙන් සියයට 75 ක් ඉදිරියට ගෙන එනු ලැබ වසර තුනක කාලපරිච්ඡේදයක් තුළ සමාන වටිනාකමින් අඩු කරනු ලැබිය හැකිය.
- ඉහත සඳහන් අයිතමයන් හැර වෙනත් යම් අයිතමයක් ඉදිරියට ගෙන එනු ලැබිය නොහැකිය.

9. 140 වැනි කොටුව - සුදුසුකම් ලබන ගෙවීම්

4 වන උපලේඛනයේ 140.08 වන කොටුවෙහි වටිනාකම් එකතුව ආදායම් බදු වාර්තාවේ 140 වැනි කොටුවෙහි ඇතුළත් කළ යුතු ය.

10. 150 වැනි කොටුව - බදු අය කළහැකි ආදායම

බදු අය කළහැකි ආදායම වන්නේ තක්සේරු කළහැකි ආදායමෙන් සුදුසුකම් ලබන ගෙවීම් අඩුකල පසු වටිනාකමයි. 140 වැනි කොටුවේ වටිනාකම 130 වැනි කොටුවේ වටිනාකමින් අඩු කර එහි ප්‍රතිඵලය 150 වැනි කොටුවේ ඇතුළත් කරන්න. බදු අය කළහැකි ආදායම සෘණ වටිනාකමක් නොවිය හැකි අතර, එවැනි අවස්ථාවක දී "ශූන්‍ය" යනුවෙන් ඇතුළත් කිරීමට කාරුණිකව සැලකිලිමත් වන්න.

11. 160 වැනි කොටුව - විශේෂ අනු ප්‍රමාණ යටතේ බදු අයකල හැකි ආදායම

දේශීය ආදායම් පනතට දෙවන උපලේඛනයේ (ආ) කොටසේ නිශ්චිතව දක්වා ඇති යම් අනුප්‍රමාණයක් හැර අනුප්‍රමාණයන්, විශේෂ අනුප්‍රමාණයන් නියෝජනය කරන අතර, අයිතමයන් <u>සමහරක්</u> පහත සඳහන් පරිදි ලැයිස්තුගත කෙරේ.

1) අධ්‍යාපන සේවාවන්ගෙන් උපයන ලාභ සඳහා සියයට 10 යටතේ බදු අය කරනු ලැබිය හැකිය.

2) දේශීය ආදායම් පනතේ 16 වැනි වගන්තියේ සඳහන් කෘෂිකාර්මික ව්‍යවසායන්ගෙන් ලාභ සියයට 10 යටතේ බදු අය කරනු ලැබිය හැකිය. (48 (අ) වගන්තිය)

3) කෘෂිකර්මාන්තයෙන්, සත්ව ආහාර නිෂ්පාදනයෙන්, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයෙන් හෝ ඉදිකිරීම් වැඩ වලින් ලාභ (දේ.ආ. පනතේ 46 වැනි වගන්තිය) සියයට 12 යටතේ බදු කරනු ලැබිය හැකිය.

4) සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම (දේ.ආ. පනතේ 51 සහ 52 වගන්ති) සියයට 12 යටතේ බදු අය කරනු ලැබිය හැකිය.

5) රු. මිලියන 750 නො ඉක්මවන වාර්ෂික පිරිවැටුමක් සහිත ව්‍යවසායක් (මිලදී ගැනීම සහ විකිණීම හැර) [දේ.ආ. පනතේ 59 (ආ) වගන්තිය] සියයට 12 යටතේ බදු අය කරනු ලැබිය හැකිය. (සමාගම් සමූහයක පරිපාලන සමාගමක්, පරිපාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් සඳහා අදාළ නොවේ.)

6) අවදානම් ප්‍රාග්ධන සමාගමකින් සියයට 12 යටතේ බදු අය කරනු ලැබිය හැකිය.

7) ඒකක භාරයක්, අන්‍යෝන්‍ය භාරයක් හෝ ඒකක භාර කළමනාකරණ සමාගමක් ඒවායේ බදු අය කළහැකි ආදායම මත සියයට 10 යටතේ බදු අයකරනු ලැබිය හැකිය.

8) යම් මත් ද්‍රව්‍ය හෝ දුම්කොළ නිෂ්පාදනය කර අලෙවි කිරීම හෝ ආනයනය කර අලෙවි කිරීම හෝ යම් ලොතරැයි හෝ ඔට්ටු හෝ සූදු කටයුතු වලින් උපයන ලාභ සහ ආදායමෙන් සියයට 40 ක් යටතේ බදු අය කරනු ලැබිය හැකිය.

9) දේශීය වශයෙන් නිෂ්පාදනය කරන අත් යන්ත්‍ර නිෂ්පාදන සඳහා සියයට 12 යටතේ බදු අය කරනු ලැබිය හැකිය.

10) සෞඛ්‍ය සුව සේවා වලින් උපයන ලාභ සඳහා සියයට 12 යටතේ බදු අය කරනු ලැබිය හැකිය.

11) තේ අපනයන කරුවකු සමඟ බද්ද ව්‍යාපාරයක් ස්ථාපනය කර ඇති තේ වගාකරුවකුගේ හෝ නිෂ්පාදකයකුගේ ලාභ සඳහා සියයට 12 යටතේ බදු අය කරනු ලැබිය හැකිය.

12) කුකුළු ගොවිපොළකින් උපයන ලාභ සඳහා සියයට 10 යටතේ බදු අය කරනු ලැබිය හැකිය.

13) අපනයනාභිමුඛ සමාගමක් විසින් භාණ්ඩ විකිණීමෙන් උපයන ලාභ සහ ආදායම සඳහා සියයට 12 යටතේ බදු අය කරනු ලැබිය හැකිය. (56 (අ) වගන්තිය)

14) විදේශ නැවකට භාණ්ඩ හෝ සේවා සැපයීමෙන් උපයන ලාභ සඳහා සියයට 12 යටතේ බදු අය කරනු ලැබිය හැකිය. (56 (ආ) වගන්තිය)

15) රෙදිපිළි පංගු මණ්ඩලය සමඟ ලියාපදිංචි රෙදිපිළි අපනයන කරුවකුට යම් රෙදිපිළි වටිනාකම වැඩිදියුණු කිරීම සඳහා උපකාර වන්නා වූ යම් රෙදිපිළි හෝ යම් වෙනත් සේවාවන්ගෙන් මැහුම් ද්‍රව්‍ය, එක්ලස් කිරීමේ සැපයුමෙන් උපයන ලාභ සහ ආදායම සඳහා සියයට 12 යටතේ බදු අය කරනු ලැබිය හැකිය. (58 වැනි වගන්තිය)

16) නිෂ්පාදන නිපදවීමේ ව්‍යාපාරයක් කරගෙන යන්නා වූ ද, 28% ක අනුප්‍රමාණය මත ආදායම් බදු ගෙවීමට යටත් වන්නා වූ ද දැනට පවත්නා සමාගමක් විසින්, 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2017 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් මිලියන 300 කට නොඅඩු (ඉඩම් හා ගොඩනැගිලි හැර) ස්ථාවර වත්කම් අත්කර ගැනීමෙහිලා ආයෝජනය කිරීම මගින් ඒ සමාගමේ ඒ නිෂ්පාදන, නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමේ දී 59 එ වගන්තියේ කොන්දේසි මත ලාභ සහ ආදායම මත අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණය රුපියල් මිලියන 500 ක් නොඉක්මවන උපරිම මුදලක් දක්වා 50% කින් අඩු කරනු ලැබිය යුතුය.

17) දැනට පවත්නා ඕනෑම ස්වභාවයක ව්‍යවසායක් යම් නිෂ්පාදන ව්‍යාපාරයක රුපියල් මිලියන 500 වැඩි මුදලක ගිවිසුම්ගත ආයෝජනයක් සහිතව, 2015 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර ආදායම් බදු කාර්ය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචි වී ඇත්තා වූ යම් සමාගමක ලාභ සහ ආදායම මත අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණය 28% ක් නම්, 59 ඒ වගන්තියේ කොන්දේසි මත සමාගමේ ලාභ සහ ආදායම මත අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණය 50% කින් අඩු කරනු ලැබිය යුතුය.

18) ආනයන සමඟ තරඟකාරීත්වයට මුහුණදෙමින් 1970 වර්ෂයේ සිට නිෂ්පාදන ව්‍යාපාරයක නිරතව සිටින යම් නිෂ්පාදකයකු විසින්, 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනතට අනුකූලව ගෙවිය යුතු යයි ගණන් බලනු ලබන ආදායම් බද්දේ කොටස, 59 ඔ වගන්තියේ කොන්දේසි මත ඒ නිෂ්පාදන දේශීය වෙළඳ පොළේ විකිණීමෙන් ලැබෙන, 28% උපරිම බදු අනුප්‍රමාණයකට යටත් වන්නා වූ ලාභ සහ ආදායම මත, ආදායම් බද්ද 10% කින් අඩු කරනු ලැබිය යුතුය.

19) අතුරු බෝග වගා කටයුතු වල හෝ එළවළු සහ ආහාර පිරිසැකසුම් කිරීමේ කටයුතුවල නිරතව සිටින යම් දේශීය ව්‍යවසායකයකු විසින්, 2015 අප්‍රේල් මස 1 වන දින හෝ

එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා 59 ඕ වගන්තියේ කොන්දේසි මත මේ පනතට අනුකූලව ගෙවිය යුතු යයි ගණන් බලනු ලබන ආදායම් බද්දේ කොටස, ඒ කටයුතුවලින් ලැබෙන ලාභ සහ ආදායම මත 50% කින් අඩු කරනු ලැබිය යුතුය.

20) යම් පසුගාමී කලාපයක පිහිටි, නිෂ්පාදන කටයුතු සඳහා හෝ සේවා සැපයීම සඳහා වන යම් ව්‍යවසායක 2015 පෙබරවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2017 මාර්තු මස 31 වන දිනට පෙරාතුව රුපියල් මිලියන 250 කට නොඅඩු මුදලක් ආයෝජනය කරන නිෂ්පාදකයකු හෝ සේවා සපයන්නකු වන යම් තැනැත්තෙකු විසින් 59 ක වගන්තියේ කොන්දේසි මත මේ පනතට අනුකූලව ගෙවිය යුතු යයි ගණන් බලනු ලබන ආදායම් බද්දේ කොටස, ඒ තැනැත්තාගේ ලාභ සහ ආදායම මත 50% කින් අඩු කරනු ලැබිය යුතුය.

විශේෂ අනුප්‍රමාණයන් යටතේ අය කළ හැකි බදු ආදායමේ කොටස සහ එම බදු අය කළ හැකි ආදායමේ කොටසට අදාළ විශේෂ අනුප්‍රමාණය 5 වන උපලේඛනයේ අදාළ කොටුව යටතේ පැහිදිලිව සඳහන් කළ යුතුය.

5 වන උපලේඛනයේ 160.06 වන කොටුවෙහි වටිනාකම වාර්තාවේ 160 කොටුවෙහි ඇතුළත් කරන්න.

12. 170 වැනි කොටුව - ඉතිරි බදු අය කළ හැකි ආදායම මත බද්ද

ඉතිරි බදු අය කළ හැකි ආදායම මත බද්ද පහත සඳහන් පරිදි ආගණනය කළ යුතුය.

(1) රු. 5,000,000/- නො ඉක්මවන බදු අය කළහැකි ආදායමක් සහිත නිෂ්පාදනය සහ සේවා ව්‍යාපාරයක නිරත යම් සමාගමක් හැර සමාගම් -

සමාගමක බදු අය කළ හැකි ආදායම (ඒකක භාරයක, අන්‍යෝන්‍ය අරමුදලක, අවදානම් ප්‍රාග්ධන සමාගමක සමාගම් සමූහයක පරිපාලක සමාගමක, පරිපාලිත සමාගමක හෝ ආශ්‍රිත සමාගමක හැර) රු. 5,000,000/- නො ඉක්මවයි නම්, එහි බදු අය කළ හැකි ආදායමට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය සියයට 12 ක් වේ.

(2) ඉහත (1) අයිතමය හෝ පනතේ වෙනත් යම් විධිවිධානයන්හි නිශ්චිතව දක්වා ඇති සහනදායී අනුප්‍රමාණය යටතට නොවැටෙන සමාගම්;

එවැනි සමාගමක ලාභ සහ ආදායම් පනතේ වෙනත් යම් විධිවිධානයන් යටතේ යම් නිශ්චිත අනුප්‍රමාණයන් යටතේ බදු නොවේ නම්, සියයට 28 යටතේ බදු අය කරනු ලැබේ.

කෙසේ වෙතත්, 12 වැනි ඡේදයේ (1) වන අයිතමයේ සඳහන් සමාගමක රු. 5,000,000/- ට වැඩි අතිරික්ත බදු අය කළ හැකි ආදායමට ආරෝපණය කළ හැකි බද්ද එම බදු අය කළහැකි ආදායමට වඩා වැඩි නම්, එවිට අතිරික්ත බදු අය කළහැකි ආදායමට වඩා වැඩි බද්දේ එම කොටස සැලකිල්ලට නොගත යුතු ය.

උදාහරණ: බදු අය කළහැකි ආදායම රු. 5,800,000/- නම්, ගෙවිය යුතු බදු වටිනාකම වන්නේ රුපියල්;

28% යටතේ රු. 5,800,000/- බදු අය කළහැකි ආදායම මත බද්ද	=	1,624,000	
12% යටතේ රු. 5,000,000/- මත බද්ද	=	600,000	
රු. මිලියන 5 ට වැඩි බදු වටිනාකමට වඩා බදු අතිරික්තය		1,024,000	**(A)**
රු. 5,000,000 වඩා බදු අය කළහැකි ආදායම	=	(5,800,000 - 5,000,000)	

800,000 **(B)**

(A)> (B) පරිදිය;

ගෙවිය යුතු බද්ද = රු. 5,000,000 මත බද්ද + රු. 5,000,000 ට වැඩි බදු අය කළ හැකි ආදායම

= (600,000 + 800,000)

= රු. 1,400,000/-

සම්පූර්ණ බදු අය කළහැකි ආදායම සියයට 28 යටතේ බදු අය කරනු ලබන්නේ නම්, සහ එම බදු අය කළහැකි ආදායම රු. 5,000,000/- ඉක්මවන නමුත් රු. 6,111,111/- නොඉක්මවයි නම්, එවිට ගෙවිය යුතු බද්දේ වටිනාකම රු. 600,000/- එකතු රු. 5,000,000/- ඉක්මවන බදු අය කළහැකි ආදායමේ වටිනාකම වේ.

සම්පූර්ණ බදු අය කළහැකි ආදායම සියයට 28 යටතේ බදු අය කළ නොවන අවස්ථාවක දී, මෙම ක්‍රමය අදාළ නොවේ.

(3) 48 වගන්තියෙහි සඳහන්, යම් ව්‍යවසායන් සඳහා පහත සඳහන් සහනදායී බදු අනුප්‍රමාණ අදාළ වේ.

- 2008.04.01 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් මත බදු ආදායමෙන් ලාභ සහ ආදායම නිදහස් වන පූර්ව ආසන්නතම කාලසීමාව අවසානයේ තක්සේරු වර්ෂයට බදු අනුප්‍රමාණයන් - 5%
- පළමු පශ්චාත් නිදහස් වසර අවසානය - 10%
- දෙවන පශ්චාත් නිදහස් වසර අවසානය - 15%

වාර්තාව සමඟ ලබාදී ඇති "බදු ගණනය කිරීමේ කාර්යය පත්‍රය" ගෙවිය යුතු ආදායම් බදු ආගණනයේ දී භාවිතයට ගත යුතුය.

13. 180 වැනි කොටුව - දළ ලාභාංශ මත බද්ද

(1) නිල ලැයිස්තුගත සමාගමක් වුවද නොවුවද යන්න නොසලකා සෑම වාසික සමාගමක්ම (ඒකක භාරයක්, හෝ අන්‍යෝන්‍ය භාරයක් හැර) තක්සේරු වර්ෂය තුළ තම කොටස් කරුවනට බෙදාහරින ලද දළ ලාභාංශයේ වටිනාකම මත සියයට 10 කට සමාන ආදායම් බදු ගෙවිය යුතුය.

(2) කෙසේ වෙතත්, "අදාළ කොටස" හැර ලාභ වලින් එම ලාභාංශය බෙදාදෙනු ලබන විට සමාගම විසින් බදු ගෙවිය යුතු නොවේ. "අදාළ කොටස" යන්නෙන්;

(අ) 7 වැනි වගන්තියේ (අ) ඡේදය යටතේ ආදායම් බද්දෙන් නිදහස් යම් සමාගමකට හෝ පුද්ගල මණ්ඩලයකට;
(ආ) 7 වැනි වගන්තියේ (ඇ) අනු ඡේදයේ සඳහන් යම් පළාත් පාලන ආයතනයක් හෝ රජයේ ආයතනයකට;
(ඇ) යම් ඒකක භාරයකට හෝ අන්‍යෝන්‍ය අරමුදලකට;
(ඈ) එම ලාභාංශයට අදාළව 10 වැනි වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් යම් හවුල් කරුවෙකුට; හෝ
(ඉ) යම් සමූපකාර සමිතියකට;
(ඊ) අපි වෙනුවෙන් අපි අරමුදලට;
(උ) වෙනත් යම් වාසික සමාගමකින් ලද යම් ලාභාංශයකින්, බෙදාදෙන ලද යම් ලාභාංශයකින් අඩු කිරීමෙන් පසුව දළ ලාභාංශයේ ශේෂය /ඉතිරිය අදහස් වේ.

(3) හවුල් කරුවන්ගෙන් එම ලාභාංශ මත බදු අඩු කිරීමට සමාගම් වෙත බලය පවරා නොමැති වුවද, සෑම වාසික සමාගමක් විසින්ම කොටස් හෝ ණයකර ආකාරයෙන් ද බෙදාදෙන ලද යම් ලාභාංශයක් මත සියයට 10 ක බදු ගෙවිය යුතුය.

(4) සමාගමක් විසින් ලාභාංශයෙන් එය ගෙවන අවස්ථාවේ දී බදු අඩු කළ යුතුය.

වසර තුළ විවිධ ලාභාංශ බෙදාදීම් කිහිපයක් පවතී නම්, එක් එක් බෙදාදීම වෙනුවෙන් 6 වන උපලේඛනයේ පිටපත් වෙන් වශයෙන් සම්පූර්ණ (ඡායාස්ථ පිටපත්) කරන්න.

(5) සමාගම විසින් එසේ අඩු කරන ලද බද්ද සහ ඉහත 2 වන අයිතමයේ සඳහන් ලාභාංශ මත බද්ද බෙදාහැරීමේ දින සිට දින 30 ක් ඇතුළත දේ.ආ. කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතුය. එසේම වැඩිමනත් වශයෙන්, ලාභාංශ මත වාර්තාවක් ද්විවාර්ෂිකව යැවිය යුතුය. එනම්, ඔක්තෝබර් 1 දින සිට මාර්තු 31 දක්වා බෙදාහරින ලද ලාභාංශ සම්බන්ධයෙන් අප්‍රේල් 30 දින හෝ එදිනට පෙර සහ අප්‍රියෙල් 1 දින සිට සැප්තැම්බර් 30 දක්වා බෙදාහරින ලද ලාභාංශ සම්බන්ධයෙන් ඔක්තෝබර් 31 දින හෝ එදිනට පෙර වන පරිදි ය.

06 වන උපලේඛනයේ 180.07 වන කොටුවෙහි වටිනාකම වාර්තාවේ 180 වැනිකොටුවේ ඇතුළත් කළ යුතුය.

14. 190 වැනි කොටුව - ප්‍රේෂණ මත බද්ද (6 අ උපලේඛනය)

ප්‍රේෂණ මත බදු නිර්වාසික සමාගම් සඳහා පමණක් අදාළ වේ. එසේම, වසර තුළ කරන ලද මුළු ප්‍රේෂණ මත එය සියයට 10 ලෙස ආගණනය කරනු ලැබේ.

"ප්‍රේෂණය" යන්නෙන් -
- ලද ලාභාංශයෙන් ප්‍රේෂණය කරන ලද මුදල හැර බද්දට අය කළ හැකි ලාභ සහ ආදායමෙන් ප්‍රේෂණය කරන ලද හෝ විදේශයේ රඳවාගන්නා ලද මුදල්.
- විදේශ විකුණුම් වලින් ලද මුදල් සහ අපනයනය කරන ලද භාණ්ඩවලින් විදේශයේ රඳවාගන්නා ලද මුදල්.
- අපනයනය කරන ලද නිෂ්පාදනයන්හි වෙළෙඳපොළ අගය මත නමුත් සම්පූර්ණයෙන් විකුණා නොමැති.

6 (අ) උපලේඛනයේ 190.06 වැනි කොටුවේ වටිනාකම වාර්තාවේ 190 වැනි කොටුවෙහි ඇතුළත් කළ යුතුය.

15. 200 වැනි කොටුව - බෙදාහැරිය හැකි ලාභය මත බද්ද (6 (ආ) උපලේඛනය)

6 (ආ) උපලේඛනයේ 200.01 කොටුවේ බෙදාහැරිය හැකි ලාභය ඇතුළත් කරන්න.

"බෙදාහැරිය හැකි ලාභ" යනු පොත් ලාභයෙන්

(i) 2016/2017 තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම මත ගෙවිය යුතු ආදායම් බදු.

(ii) 2016/2017 වර්ෂයේ යම් ඉඩමක් හෝ යම් වෙනත් ප්‍රාග්ධන වත්කමක් අත්පත් කර ගැනීමෙහි ලා සමාගම විසින් දරන ලද පිරිවැය (වේ නම්); සහ

(iii) යම් ප්‍රාග්ධන වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීම මත ආගණනය කළ පොත් කළ මුළු මති මාත්‍ර ලාභය

අඩු කර;

i. 2016/2017 වර්ෂයේ අත්පත් කරගත්තා වූ ප්‍රාග්ධන වත්කම් සම්බන්ධයෙන් පොතේ ලාභ යටතේ ගණනය කිරීමේ දී අඩු කරන ලද යම් ක්ෂය දීමනාව; සහ

ii. පොතේ ලාභයෙහි ඇතුළත් ප්‍රාග්ධන වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම මත යම් මුළු මති මාත්‍ර පාඩු

එකතු කිරීමෙන් ලැබෙන අගය අදහස් වේ.

2017 සැප්තැම්බර් 30 දින හෝ එදිනට පෙර 2016/2017 තක්සේරු වර්ෂයේ බෙදාහැරිය හැකි ලාභයෙන් බෙදාහරින ලද දළ ලාභාංශයේ වටිනාකම 200.02 කොටුවෙහි ඇතුළත් කරන්න.

200.03 වන කොටුවෙහි, 2016/17 තක්සේරු වර්ෂයේ බෙදාහැරිය හැකි ලාභයෙන් සියයට 10 ට සමාන වටිනාකම ඇතුළත් කරන්න. එනම්, 200.01 කොටුවෙහි වටිනාකම.

200.04කොටුවෙහි, 2016/17 තක්සේරු වර්ෂයේ බෙදාහැරිය හැකි ලාභයෙන් සියයට 33 1/3 කට සමාන වටිනාකම ඇතුළත් කරන්න. එනම් 200.01 කොටුවෙහි වටිනාකම.

200.05 කොටුවෙහි, 200.02 කොටුවෙහි වටිනාකමට වැඩි 200.04 කොටුවෙහි වටිනාකම ඇතුළත් කරන්න.

එවිට, 200.02 කොටුවේ වටිනාකම 200.03 කොටුවේ වටිනාකමට වඩා අඩු නම්, බෙදාහැරිය හැකි ලාභය මත (එනම්, 200.05 කොටුවේ වටිනාකමෙන් සියයට 15) මත (අතිරික්තය) ගෙවිය යුතු බද්ද ආගණනය කර 200.06 කොටුවෙහි ඇතුළත් කරන්න.

200.02 කොටුවේ වටිනාකම 200.03 කොටුවේ වටිනාකමට වඩා වැඩි නම්, එවිට බෙදාහැරිය හැකි ලාභ මත ගෙවිය යුතු බදු නොමැති අතර 200.06 කොටුවෙහි ශුන්‍ය අගය ඇතුළත් කරන්න.

6 (ආ) උපලේඛනයේ 200.08 කොටුවේ වටිනාකම වාර්තාවේ 200 වැනි කොටුවේ ඇතුළත් කළ යුතුය.

16. 210 වැනි කොටුව - ගෙවිය යුතු මුළු බද්ද

7 වන උපලේඛනයේ (220.01 සිට 220.09 දක්වා) කොටුවල ඇතුළත් වටිනාකමේ එකතුව ලෙස ගෙවිය යුතු බදු එකතුව ලෙස 210 වැනි කොටුවෙහි ඇතුළත් කරන්න.

17. 220 වැනි කොටුව - මුළු බදු බැර

7 වන උපලේඛනයේ එක් එක් කොටුවට අදාළ විස්තර කිරීම් එම පිළිවෙල අනුව පහත දක්වා ඇත.

17.1. 220.01 වැනි කොටුව - ගෙවන ලද ප්‍රේෂණ බද්ද

නිර්වාසික සමාගම් සඳහා අදාළ වේ.

6 (අ) වන උපලේඛනයේ 190.06 කොටුවේ ගෙවන ලද මුළු ප්‍රේෂණ බදු වටිනාකම 7 වන උපලේඛණයේ 220.01 වැනි කොටුවේ ඇතුළත් කරන්න.

17.2. 220.02 වැනි කොටුව - ද්විත්ව බදු සහන

ශ්‍රී ලංකාව විසින් ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුමකට එළඹ ඇති විදේශ රටක දී ගෙවන ලද බදු සඳහා දිය හැකි යම් බදු බැරක් වෙනුවෙන් 220.02 කොටුවෙහි දී ඉල්ලුම් කළ හැකිය. එකී ඉල්ලීම සහතිකයක් මගින් සනාථ කළ යුතු අතර, විදේශ බදු බැර අදාළ වන ලාභ හෝ ආදායමේ එම කොටස මත බදු වටිනාකමට සීමා විය යුතුය.

17.3. 220.03 - අඩු කළ හැකි ආර්ථික සේවා ගාස්තු

7 (අ) වැනි උපලේඛනයේ E කොටුවේ ඇතුළත් වටිනාකම 220.03 කොටුවේ ආ.සේ.ගා. වටිනාකම ලෙස ඇතුළත් කරන්න.

17.4. 220.04 වැනි කොටුව - ස්ව තක්සේරු බදු ගෙවීම් (SA බදු ගෙවීම්)

කාර්තුමය වාරික ලෙස ස්ව තක්සේරු යටතේ ගෙවන ලද මුළු ආදායම් බදු වටිනාකම සහ අදාළ තක්සේරු වර්ෂය සඳහා (එනම්2017/2018) අවසන් ගෙවීම පමණක් 220.04 වන කොටුවෙහි ඇතුළත් කරන්න.

17.5. 220.05 වැනි කොටුව - ගෙවන ලද ලාභාංශ බද්ද

වසර තුළ සමාගම විසින් ගෙවන ලද ලාභාංශ බදු වේ නම්, මෙම කොටුවේ ඇතුළත් කළ යුතුය.

17.6. 220.06 වැනි කොටුව -බෙදා හැරිය හැකි ලාභාංශ මත බද්ද

වසර තුළ සමාගම විසින් ගෙවා ඇති බෙදා හැරිය හැකි ලාභාංශ මත බදු වේ නම්, මෙම කොටුවේ ඇතුළත් කළ යුතුය.

17.7. 220.07 වැනි කොටුව - පොලිය මත රඳවා ගැනීමේ බද්ද

අවසනාත්මක නොවන යම් රඳවා ගැනීමේ බදු වටිනාකම මෙහි ඇතුළත් කරන්න. **රඳවාගැනීමේ බදු සහතිකවල ඡායාපිටපතක් ඇමිණිය යුතුය.**

17.8. 220.08 වැනි කොටුව - මති මාත්‍ර බදු බැර

7 (ආ) උපලේඛණයේ D කොටුවෙහි ද්විතියික වෙළඳපොල ගණුදෙනුවලින් යම් පොලියක් මත යම් මති මාත්‍ර බදු බැර වටිනාකම 220.08 වැනි කොටුවෙහි ඇතුළත් කරන්න.

17.9. 220.09 වැනි කොටුව - අනෙකුත් සහන

විස්තර සහිතව වෙනත් යම් සහනයන්හි වටිනාකම් ඇතුළත් කරන්න.

වෙනත් යම් බදු සහන (160 වන වගන්තිය යටතේ ගෙවන ලද රඳවා ගැනීමේ බදු වැනි) අඩු කළ හැකි නමුත් වාර්තා ආකෘති පත්‍රයේ හෝ උපලේඛනයන්හි වෙනත් අවස්ථාවකදී හිමිකම් නොකියන ලද සහන මෙම කොටුවෙහි ඇතුළත් ක යුතුය. කරුණාකර එම හිමිකම් පිළිබඳ සම්පූර්ණ විස්තර වෙනම පත්‍රයකින් ලබා දෙන්න.

18. 220.10 වැනි කොටුව - මුළු බදු බැර

අංක 220.01 සිට 220.09 දක්වා වටිනාකම්හි එකතුව 7 වන උපලේඛනයේ 220.10 කොටුවෙහි සහ වාර්තාවේ 220 වැනි කොටුවෙහි ඇතුළත් කළ යුතුය.

18.1. 225.01 වෙනි කොටුව පසුගිය වර්ෂයේ ඉදිරියට ගෙන ආ ආදායම් බදු ආපසු ගෙවීම්

පසුගිය වර්ෂවල පවතින ආදායම් බදු ආපසු ගෙවීම් වල සම්මුචිත ප්‍රමාණය මෙම කොටුවේ ඇතුලත් කරන්න. (මෙම අගය අනෙකුත් සහන යටතේ ප්‍රකාශ නොකරන්න (220.09))

18.2. 230 වැනි කොටුව හෝ 240 වැනි කොටුව - ගෙවිය යුතු හෝ ආපසු ගෙවිය යුතු බදු වටිනාකම ගණනය කිරීම

210 වැනි කොටුවේ දත්ත 220 වැනි කොටුවේ දත්ත වලට වඩා වැඩි නම්, එකී දත්ත දෙක අතර වෙනස ගෙවිය යුතු බදු වටිනාකම ලෙස 230 වැනි කොටුවෙහි ඇතුළත් කරන්න. 220 වැනි කොටුවේ දත්ත 210 වැනි කොටුවේ දත්ත වලට වඩා වැඩි නම්, එකී දත්ත දෙක අතර වෙනස හිමිකම් කියන ලද ආපසු ගෙවීම් ලෙස 240 වැනි කොටුවෙහි ඇතුළත් කරන්න.

2 වැනි කොටස

ව්‍යාපාර පිරිවටුම දළ ලාභය සහ අනිකුත් ආදායම් ආදී විස්තර වාර්තාවේ 02 වැනි කොටසෙහි සඳහන් කරන්න.

3 වැනි කොටස

සමාගමේ ලේකම් හෝ ප්‍රධාන නිලධාරියා සහ කළමනාකාර අධ්‍යක්ෂකගේ නම වාර්තාවේ 2 වැනි කොටසින් ලබා දිය යුතුය. සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ, අධ්‍යක්ෂක, ලේකම් හෝ ප්‍රධාන නිලධාරියා විසින් ඔහුගේ /ඇයගේ නම සහ පදවිනාමය සඳහන් කරමින් වාර්තාව අත්සන් කොට දිනය සඳහන් කළ යුතුය.

ඔබට යම් සහායක් හෝ පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම්, 1944 දුරකථන අංකය මගින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න.. **මෙම උපදෙස් මාලාවේ ඉංග්‍රීසි හා දෙමළ පරිවර්තනයන්** දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය (www.ird.gov.lk) මගින් බා ගත හැකි **බව කාරුණිකව සලකන්න.**

බදු - වඩා හොඳ අනාගතයකට
வரிகள் – வளமான எதிர்காலத்திற்காக
TAXES - FOR A BETTER FUTURE